# සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු තැගි අරමුදල - 2011

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණ වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2011 දෙසැම්බර් 31 දිනට සරාබදු තැගි අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාර්ත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ගිණම්කරණ අඩුපාඩු

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේදී වාහන සඳහා ක්ෂය වෙන්කිරීම රු. 285,000 ක් අඩුවෙන් ගණනය කර ගිණුම්වල දක්වා තිබීම හේතුවෙන් වර්ෂයේ වියදම එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද ස්ථාවර වත්කම් වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් ද දැක්වුණි.

(ආ) 2010 වර්ෂයේ මිලදී ගත් වාහන 07 ක් වැඩි දියුණු කිරීම (කැනපි ගැසීම) සඳහා දරන ලද රු.652,750 ක මුදල ප්‍රාග්ධනීත නොකර වියදම් ලෙස කපා හැරීම හේතුවෙන් වර්ෂයේ ආදායම සහ ස්ථාවර වත්කම් (වාහන) වටිනාකම එම ප්‍රමාණවලින් අඩුවෙන් දැක්වුණි.

#### 1.2.2 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති,රීති රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1999 අංක 08 දරන දුම්කොළ බදු පනතේ 17 වගන්තිය | දුම්කොළ බදු පනත යටතේ අය කරනු ලබන දඩ මුදලින් 25% ක් තැගි මුදල් ගෙවීමට හිමිකම් ලබන අතර, ඒ සඳහා පනතේ 17 (ii) වගන්තිය අනුව අමාත්‍යවරයා විසින් යෝජනා කරන ක්‍රමයක් අනුව සුරාබදු කොමසාරිස් ජනරාල්වරයාගේ පාලනය යටතේ පවතින තැගි අරමුදලක් ස්ථාපිත කර ගත යුතු වුවද, එවැනි අරමුදලක් ඇති කර නොතිබුණි. |

(ආ) මුදල් රෙගුලාසි

| | |
|---|---|
| (i) 272 (1) | ගෙවන ලද වවුචර් අනුක්‍රමික අංක අනුව පිළියෙල කර ආරක්ෂාකාරව තබා ගත යුතු වුවත්, 2011 වර්ෂය සඳහා වූ ගෙවීම් වවුචර් අනුක්‍රමික අංක අනුව ගොනු කර මිටි බැඳ නොතිබුණි. |
| (ii) මු. රෙ. 756 | මුදල් වර්ෂය අවසන් වූ වහාම අරමුදල සතු වත්කම් පිළිබඳ සමීක්ෂණයක් පැවැත්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු. 23,361,469 ක් වටිනා ස්ථාවර වත්කම් පිළිබඳව භෞතික සමීක්ෂණයක් පවත්වා නොතිබුණි. |

## 2. <u>මූල්‍ය සමාලෝචනය</u>

### 2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

සමාලෝචිත වර්ෂය තුල අරමුදලේ මෙහෙයුම් කටයුතුවලින් රු. 17,245,710 ක ශුද්ධ අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ රු. 41,228,732 ක ශුද්ධ අතිරික්තයක් වූයෙන්, මූල්‍ය ප්‍රතිඵලවල රු.23,983,022 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. සමථ ලැබීම් රු. 24,387,872 ක් හෙවත් 20% කින් අඩු වී තිබීම මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමට මූලිකව බලපා තිබුණි.

## 3. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

### 3.1 <u>කාර්ය සාධනය</u>

පහත සඳහන් කරුණ නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයට අදාලව කාර්මික අපරාධ සහ සුරාබදු අපරාධ සම්බන්ධයෙන් වූ ඇස්තමේන්තුගත වැටලීම් ප්‍රමාණය 5,292 ක් සහ 43,555 ක් වුවද සත්‍ය වැටලීම් ප්‍රමාණය 4,597 ක් සහ 40,738 ක් විය.

(ආ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ සමථ ගාස්තු ආදායමෙහි රු.17,705,872 ක් හෙවත් 16% කද දුම්කොළ බදු ආදායමෙහි රු.6,682,000 ක් හෙවත් 65% කද අඩුවීමක් පැවතුණි.

(ඇ) දෙපාර්තමේන්තුවේ අරමුණු වෙනුවෙන් සෘජුවම දායකවන නිලධාරීන්ගේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ක්‍රමවේදයන් සඳහා සහ පුහුණු කිරීමේ කටයුතු වෙනුවෙන් අරමුදලේ දායකත්වය මුළු වියදමෙන් අවම මට්ටමක පැවතුණි.

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 සංයුක්ත සැලැස්ම

අරමුදලේ දර්ශනය සහ මෙහෙවර ඉටු කර ගැනීම සඳහා සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණි.

### 4.2 අභ්‍යන්තර විගණනය

සමාලෝචිත වර්ෂය තුල අරමුදලේ කටයුතු පිළිබඳව දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකය

විසින් විගණන කටයුතු කිසිවක් සිදු කර නොතිබුණි.

### 4.3 අයවැය ලේඛනමය පාලනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) විශේෂ රාජකාරි හෝ විශේෂ වැටලීම් සඳහා සහ ලී බඩු උපකරණ සහ වෙනත් දෑ මිලට ගැනීම සඳහා අයවැයෙන් වෙන් කර තිබුණු පිළිවෙලින් රු.600,000 ක් 11,000,000 ක් වූ වියදම් වලින් රු.512,330 ක් සහ රු.6,933,503 ක් එනම් 85 % ක් සහ 63 % ක් ඉතිරි වී තිබුණි.

(ආ) ක්‍රීඩා විනෝද සහ සුබසාධක වැඩවලට හා පුස්තකාල පොත් මිලදී ගැනීම වෙනුවෙන් රු.50,000 ක් බැගින්ද, ප්‍රශංසනීය වැඩ, පුහුණු කර්ම් හා අධ්‍යයන කර්තව්‍ය වෙනුවෙන් රු.500,000 ක්ද නිර්ගීත ක්‍රියා හෝ විශේෂ පිළිගැනීම් කළ යුතු ක්‍රියාවලට ගෙවීම් සඳහා රු.200,000 බැගින් වෙන් කර තිබුණද, මෙම සම්පූර්ණ මුදල් ප්‍රමාණයන් වැය නොකර ඉතිරිව පැවතුණි. අංක 801 දරන සුරාබදු නිවේදනයේ 4.5 වගන්තිය ප්‍රකාරව ප්‍රශංසනීය වැඩ, නිර්ගීත ක්‍රියා හො විශේෂ පිළිගැනීමක් කළ යුතු වෙනත් ක්‍රියාවලට තැගි අරමුදලින් ගෙවීමේ ක්‍රමවේදය මෙතෙක් ක්‍රියාත්මක වී නොතිබුණද, සමාලෝචිත වර්ෂයේ අයවැය මගින් ඒ සඳහා ඉහත පරිදි රු.200,000 ක මුදලක් වෙන් කර තිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සුරාබදු කොමසාරිස් ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) අයවැය පාලනය

(ආ) දුම්කොළ බදු පනත යටතේ වූ තැගි අරමුදල ස්ථාපනය කිරීම

(ඇ) භාණ්ඩ සමීක්ෂණය